(හත්වැනි පාර්ලිමේන්තුව — පළමුවැනි සභාවාරය)

අංක. 98.]

# පාර්ලිමේන්තුවේ න්‍යාය පත්‍රය

**2011 ජූනි මස 22 වැනි බදාදා අ. භා. 1.00 ට**

## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

0041/’10

1.

ගරු රවි කරුණානායක මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (5)

(අ) පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ හිටපු සභාපතිවරුන් වන ගරු ජෝන් අමරතුංග, ගරු ජෙයරාජ් ප්‍රනාන්දුපුල්ලේ සහ ගරු රෝහිත බෝගොල්ලාගම යන මහත්වරුන් විසින් ඉදිරිපත් කරන ලද කෝප් (COPE) වාර්තා සහ 2007 ජනවාරි 12 වැනි දින ගරු විජයදාස රාජපක්ෂ මහතා විසින් ඉදිරිපත් කරන ලද වාර්තාව සම්බන්ධයෙන් ගනු ලැබූ ක්‍රියාමාර්ග එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) හිටපු විගණකාධිපති මායාදුන්න මහතා විසින් ඉදිරිපත් කරන ලද 2006 ජූලි 20 දිනැති වාර්තාව සහ රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේ සභාපති ගරු රවුෆ් හකීම් මහතා විසින් 2007 නොවැම්බර් 29 වැනි දින ඉදිරිපත් කරන ලද අංක PS12 දරන වාර්තාව සම්බන්ධයෙන් ගනු ලැබූ ක්‍රියාමාර්ග කවරේද;

(ii) ඉහත වාර්තාවලට අනුව විමර්ශනය කරන ලද ආයතනවල නම් කවරේද;

(iii) කාරක සභා වාර්තාවේ සඳහන් උපදෙස් අනුව ආරම්භ කරන ලද ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0529/’10

2.

ගරු දයාසිරි ජයසේකර මහතා,— ආර්ථික සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) (i) නැගෙනහිර පළාතේ, තිරුක්කොන්ඩියාඩුමඩු - ජයන්තිපුර මාර්ගය සංවර්ධනය කිරීම සඳහා යෝජිත මාර්ගයක්ද;

(ii) එසේ නම්, එම මාර්ගය මේ වන විට සංවර්ධනය කරමින් පවතින්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) මෙම මාර්ගයේ සංවර්ධන කටයුතු කරනු ලබන්නේ නම්,

(i) එහි දිග කිලෝමීටර් කොපමණද;

(ii) එහි වැඩ අවසන් කිරීමට යෝජිත දිනය කවරේද;

(iii) ඒ සඳහා ඇස්තමේන්තුගත මුදල කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) මෙම මාර්ගය ඉදිකිරීම සඳහා ටෙන්ඩර් කැඳවනු ලැබුවේද;

(ii) එසේ නම්, ටෙන්ඩර් ඉදිරිපත් කරන ලද ආයතනවල නම් කවරේද;

(iii) ඒ ඒ ආයතන විසින් ඉදිරිපත් කරන ලද ටෙන්ඩර් මිල ගණන් කවරේද;

(iv) ටෙන්ඩරය පිරිනමන ලද ආයතනය හා අදාළ ටෙන්ඩර් මුදල කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) (i) මෙම මාර්ගය ඉදිකිරීම සඳහා ඇස්තමේන්තු ගත මුළු මුදල දේශීය අරමුදල්වලින් ලබා ගත්තේද;

(ii) නොඑසේ නම්, විදේශ ආධාර මගින් ලබා ගත්තේද;

(iii) විදේශ ආධාර ලබා ගත්තේ නම්, එම ආධාර ලබාදුන් රටේ නම කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඉ) නොඑසේ නම්, ඒ මන්ද?

0801/'10

3.

ගරු බුද්ධික පතිරණ මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) (i) මාතර දිස්ත්‍රික්කයේ රජය මගින් පාලනය වන ජාතික පාසල් සංඛ්‍යාව කොපමණද;

(ii) එම පාසල්වල නම්, ලිපිනයන් හා දුරකථන අංක කවරේද;

(iii) එම පාසල් අතරින් ගුරු අතිරික්තයක් පවතින පාසල් කවරේද;

(iv) ගුරු අතිරික්තයක් පවතින විෂයයන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) එම පාසල්වලින් ගුරු ඌනතා පවතින පාසල් කවරේද;

(ii) ගුරු ඌනතාවයන් පවතින විෂයයන් කවරේද;

(iii) ගුරු ඌනතා පවතින පාසල්වලට ගුරුවරුන් ලබාදීමට කටයුතු කරන්නේද;

(iv) එසේ නම්, ඒ සඳහා ගතවන කාලය කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0905/'10

4.

ගරු එම්. ටී. හසන් අලි මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) (i) වසර පහකට අධික කාලයක් නැගෙනහිර පළාතේ කොන්ත්‍රාත් පදනම යටතේ අඛණ්ඩව සේවයකරමින් සිටි ඉංග්‍රීසි ගුරුවරුන් පිරිසක් සඳහා අදියර දෙකකින් (රා.ප.චක්‍රලේඛ අංක 13/2005 සහ 21/2006 යටතේ) ස්ථිර පත්වීම් පිරිනමන ලද බවත්;

(ii) ඉහත රා.ප. චක්‍රලේඛවලට අනුව, අධ්‍යාපන අමාත්‍යාංශ ලේකම්ගේ ED/2/29/4/1/46 හා 2005/7/19 දිනැති ලිපියේ සඳහන් උපදෙස් පරිදි, 2005/7/28 දින සිට ඉහත ගුරු පිරිසෙන් කොටසකට පත්වීම් ලබාදී ඇති නමුත්, 2003 - 2004 වර්ෂයේ සිට කොන්ත්‍රාත් පදනම යටතේ අඛණ්ඩව සේවය කරන 50 දෙනෙකු පමණ වූ ගුරු පිරිසකට මේ දක්වා ස්ථිර පත්වීම් ලබාදී නොමැති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) අම්පාර දිස්ත්‍රික්කයේ, අම්පාර, අක්කරපත්තුව සහ සම්මන්තුරේ යන අධ්‍යාපන කලාපවලට අයත් පාසල්වල සේවයේ නියුතු එවැනි ගුරුවරුන්ට ස්ථිර පත්වීම් ලබා දීමටත්;

(ii) මඩකලපුව දිස්ත්‍රික්කයේ පඩ්ඩිරිප්පු, කල්කුඩා සහ මඩකලපු යන අධ්‍යාපන කලාපවලට අයත් පාසල්වල සේවයේ නියුතු එවැනි ගුරුවරුන්ට ස්ථිර පත්වීම් ලබාදීමටත්;

නොපමාව පියවර ගන්නේද, යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1170/'11

5.

ගරු තිස්ස අත්තනායක මහතා,— තැපැල් සේවා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) විශ්ව තැපැල් දිනය වෙනුවෙන් 2010.10.04 වැනි දින කටුබැද්ද ජාතික ආධුනිකත්ව මණ්ඩල ශ්‍රවණාගාරයේදී උත්සවයක් පැවැත්වූ බවත්;

(ii) ඊට අමතරව එම දිනය සැමරීමට තැපැල් දෙපාර්තමේන්තුවේ නිලධාරීන් පිරිසක් ජෙට් ලයිනර් නැවේ රාත්‍රී භෝජන සංග්‍රහයක් සහිතව සුහද හමුවක් පැවැත්වූ බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) එම සාදය සඳහා තැපැල් දෙපාර්තමේන්තුව වැය කළ මුදල කොපමණද;

(ii) එසේ මුදල් වියදම් කිරීමට නිසි පරිදි අනුමතිය ලබා ගෙන තිබුනේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) වාර්ෂිකව රුපියල් බිලියන 26ක පමණ පාඩුවක් ලබන තැපැල් දෙපාර්තමේන්තුවේ සේවා අවශ්‍යතා සහ කාර්ය මණ්ඩල අවශ්‍යතා සම්පූර්ණ කිරීමට තිබියදී එය පසෙකලා මෙලෙස මුදල් වියදම් කිරීම ආසාධාරණ බව එතුමා පිළිගන්නේද;

(ii) එසේ නම්, ඒ සම්බන්ධයෙන් ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0584/'10

6.

ගරු රවී කරුණානායක මහතා,— මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) පසුගිය වර්ෂ හතරක කාලය තුළ ද්විපාර්ශ්වික පදනම මත මිත්‍ර රටවලින් සහ බහුපාර්ශ්වික ආයතනවලින් ලබා ගන්නා ලද ණය මුදල් ආපසු ගෙවීමට ලබාදෙන කාලය සහ ණය ආපසු ගෙවීම සඳහා ලබා දෙන ලද සහන කාල සීමාව සම්බන්ධයෙන් කරන ලද අලුත්කිරීම් කවරේද;

(ii) එවැනි පහසුකම් ලබාදෙන ලද දිනය කවරේද;

(iii) එවැනි පහසුකම් ලබා දීමේ අරමුණ කවරේද;

(iv) ඉහත කී ණය මුදල් සම්බන්ධයෙන් කිසියම් ආරම්භක ගාස්තුවක්, පොරොන්දු ගාස්තුවක්, කළමනාකරන හෝ පරිපාලන ගාස්තුවක්, රක්ෂණ වාරිකයක්, සහ හෝ වෙනත් කිසියම් නමකින් හැඳින්වෙන පිරිවැයක් දැරීමට සිදුවී තිබේද;

(v) එක්වර ගෙවිය යුතු ගෙවීම් හෝ වාර්ෂිකව ගෙවිය යුතු ගෙවීම් තිබේද;

(vi) පිරිවැය සාධකයක් ලෙස රට කෙරෙහි බලපෑමක් ඇති කරන ඉහත කී ගෙවීම් සඳහා වර්ෂයකට ගෙවීමට තිබෙන මුදල් ප්‍රමාණයන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

0937/'10

7.

ගරු බුද්ධික පතිරණ මහතා,— ආර්ථික සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) වර්ෂ 2005 ජූනි සිට 2010 ජූනි දක්වා වර්ෂ 5 තුළ මාතර දිස්ත්‍රික්කයේ, එක් එක් ප්‍රදේශීය ලේකම් කොට්ඨාසය සඳහා, වෙන් වෙන් වශයෙන්, වාර්ෂිකව,

(i) සමෘද්ධිලාභීන්ට සහනාධාර ලබා දීම සඳහා වැය කළ මුදල;

(ii) සමෘද්ධි සහනාධාර ලැබූ පවුල් සංඛ්‍යාව;

(iii) ආර්ථිකය වර්ධනයවීම හේතු කොටගෙන සමෘද්ධි සහනාධාර පත්‍ර නැවත රජයට භාරදුන් සමෘද්ධිලාභීන්ගේ සංඛ්‍යාව;

(iv) අලුතින් සමෘද්ධි සහනාධාර ලබා දුන් පවුල් සංඛ්‍යාව;

කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

0960/'10

8.

ගරු දයාසිරි ජයසේකර මහතා,— විදුලි සංදේශ හා තොරතුරු තාක්ෂණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ භාවිතාවන දුරකථන ජාලයන් හරහා සිදුවන දෙබස්වලට සවන්දීම හෝ පටිගත කිරීම සඳහා උපකරණ පද්ධතියක් රජය හෝ යම් ආයතනයක් විසින් මෙරටට ගෙන්වා හෝ ස්ථාපිත කර තිබේද;

(ii) එසේ නම්, එහි වටිනාකම කොපමණද;

(iii) එම පද්ධතිය මගින් ආවරණය වන දුරකථන සංඛ්‍යාව කොපමණද;

(iv) එවැනි පද්ධතියක් ගෙන්වීමේ අරමුණ කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

0977/'10

9.

ගරු එම්. ටී. හසන් අලි මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) (i) අධ්‍යාපන අමාත්‍යාංශය මගින් අඩු පහසුකම් සහිත පාසල් ලෙස හඳුනාගෙන තිබෙන පළාත් සභා සහ මධ්‍යම රජය යටතේ පවතින පාසල් සංඛ්‍යාව කොපමණද;

(ii) එම පාසල් අතුරින් මුස්ලිම් පාසල් හා වතු පාසල් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) එම පාසල්වල දියුණුව උදෙසා ඉදිරියේදී ක්‍රියාත්මක කිරීමට අපේක්ෂා කරන වැඩ සටහන් දිස්ත්‍රික් මට්ටමින්, වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1172/’11

10.

ගරු තිස්ස අත්තනායක මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) “අපි වෙනුවෙන් අපි” රණවිරු අරමුදලේ බලධාරීන් විසින් එම ව්‍යාපෘතිය යටතේ මුදල් එකතුකර රණවිරුවන් සඳහා නිවාස ඉදිකිරීමට පියවර ගන්නා බව මාධ්‍ය මගින් රටට ප්‍රකාශ කරන ලද බවත්;

(ii) ඒ අනුව එම අරමුදල සඳහා දේශීය මෙන්ම විදේශීය පරිත්‍යාගශීලීන් විසින් රණවිරුවන් වෙනුවෙන් විශාල මුදල් ප්‍රමාණයක් පරිත්‍යාග කර ඇති බවත්;

(iii) මෙම වැඩපිළිවෙළ යටතේ ඉපලෝගම රණජයපුර ඉදිකරන ලද නිවාස යෝජනා ක්‍රමයෙන් නිවාස ලබා දීමේදී රණවිරුවන්ගෙන් මුදල් අය කළ බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) රණවිරුවන් සඳහා නොමිලේ නිවාස ඉදිකර දෙන බව ප්‍රකාශ කරමින් මුදලට නිවාස ලබා දීමත්;

(ii) මුදල් ගෙවීමට අකමැති වූ රණවිරුවන් එම නිවාසවලින් ඉවත් කිරීමත්;

සාධාරණ නොවන බව එතුමා පිළිගන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0720/’10

11.

ගරු රවී කරුණානායක මහතා,— ඛනිජ තෙල් කර්මාන්ත අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ අතුරු නිෂ්පාදනයක් වන ගෑස්, ලාෆ්ස් ගෑස් සමාගම වෙත ලබාදීම සඳහා වන ගිවිසුමකට එම සංස්ථාව අත්සන් කළ දිනය කවරේද;

(ii) මෙම ගිවිසුම අත්සන් කරනු ලැබුවේ කවර පදනමක් යටතේද;

(iii) ටෙන්ඩර් ක්‍රියාපටිපාටියක් අනුගමනය කිරීමෙන් අනතුරුව එම ගිවිසුමට අත්සන් කරනු ලැබුවේද;

(iv) නොඑසේ නම්, එය සිදුකළ ආකාරය කවරේද;

(v) එවැනි ගිවිසුමක් පිළිබඳව තීරණ ගැනීමට සහ එවැනි ගිවිසුමක් අත්සන් කිරීමට බලය පවරා ඇති පුද්ගලයින්ගේ නම් කවරේද;

(vi) ඉහත කී සමාගම විසින් සපුරාලිය යුතු කොන්දේසි සහ ඔවුන් විසින් විකුණන ගෑස්වල මිල කවරේද;

(vii) ගිවිසුමට අනුව සමාගම විසින් සපුරා නොමැති කොන්දේසි කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවට ගෑස් අලෙවිකිරීමේ කටයුතු ආරම්භ කළ හැකිද;

(ii) එලෙස අලෙවි කළ හැකි නම්, එසේ නොකර සිටීමට හේතු කවරේද;

(iii) සංස්ථාවට ගෑස් අලෙවිකිරීමට ඇති බාධා කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) ටෙන්ඩර් පටිපාටියක් අනුගමනය කිරිමකින් තොරව තෝරාගත් එක් සමාගමකට පමණක් ගෑස් අලෙවිකිරිම නිසා මෙම ගිවිසුමේ දිනයේ සිට මේ දක්වා වාර්ෂිකව, ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවට අහිමි වූ ආදායම කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0942/'10

12.

ගරු බුද්ධික පතිරණ මහතා,— ආර්ථික සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මාතර දිස්ත්‍රික්කය තුළ ජාතික සවිය හා ගම නැගුම ව්‍යාපෘති යටතේ සංවර්ධන කටයුතු ආරම්භ කර ඇති ග්‍රාමීය මාර්ග සංඛ්‍යාව කොපමණද;

(ii) ඒවායේ නම් කවරේද;

(iii) ඒ සඳහා වැය කිරීමට අපේක්ෂිත මුදල කොපමණද;

(iv) එම ව්‍යාපෘතීන් යටතේ ප්‍රතිලාභ ලබන පවුල් සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

0961/'10

13.

ගරු දයාසිරි ජයසේකර මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 5 වසර ශිෂ්‍යත්ව විභාගය සමත්, දැනට ශිෂ්‍යාධාර ලබන මුළු සිසුන් සංඛ්‍යාව කොපමණද;

(ii) ශිෂ්‍යාධාර ලබන සිසුවෙකුට එක් මාසයකදී ශිෂ්‍යාධාර ලෙස ගෙවනු ලබන මුදල කොපමණද;

(iii) එක් වර්ෂයක් තුළ ශිෂ්‍යාධාර ගෙවනු ලබන මාස ගණන සහ එක් සිසුවෙකු වෙනුවෙන් ශිෂ්‍යාධාර ගෙවනු ලබන වර්ෂ ගණන කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ශිෂ්‍යාධාර ගෙවීමට මාසයේ නිශ්චිත දිනයක් වෙන් කර තිබේද;

(ii) එසේ නම්, එම දිනය කවරේද;

(iii) 2010 වර්ෂයේ එක් එක් මාසය සඳහා ශිෂ්‍යාධාර ලබා දීමට වෙන් කළ දින වකවානු කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) 2010 වර්ෂයේදී නිසි පරිදි නියමිත කාල සීමාවට අනුව ශිෂ්‍යාධාර ගෙවා නොමැති බවත්;

(ii) එබැවින් අඩු ආදායම්ලාභී පවුල්වලට අයත් ශිෂ්‍යාධාරලාභී දරුවන්ගේ අධ්‍යාපන කටයුතු නිසි පරිදි කරගෙන යාමට නොහැකි තත්ත්වයක් පැන නැගී ඇති බවත්;

එතුමා පිළිගන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0981/'10

14.

ගරු එම්. ටී. හසන් අලි මහතා,— විදේශ රැකියා ප්‍රවර්ධන හා සුබසාධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) (i) සෞදි අරාබි රාජ්‍යයේ ක්‍රියාත්මක වන නීතිය ඉස්ලාමීය ෂරීආ නීතිය බවත්;

(ii) ඉස්ලාමීය ෂරීආ නීතිය අනුව අධිකරණය විසින් යම් පුද්ගලයෙකුට මරණ දඬුවමක් නියම කිරීමේදී අදාළ වැරදිකරු නීති විරෝධී ක්‍රියාව හෝ අපරාධය සිදුකරන දිනය වන විට වයස අවුරුදු 18 ක් සම්පූර්ණවීම සැලකිල්ලට ගන්නා බවත්;

(iii) මේ වන විට සෞදි අරාබියේදී මරණ දඬුවම නියමවී ඇති රිසානා නෆීක් මෙනෙවිය එම අපරාධ චෝදනාවට ලක්වන අවස්ථාවේ දී ඇගේ සැබෑ වයස අවුරුදු 17ක් බවත්;

එතුමා පිළිගන්නෙහිද?

(ආ) (i) එසේ නම්, රිසානා මෙනෙවියට ව්‍යාජ උප්පැන්න සහතිකය, ජාතික හැඳුනුම්පත, ශ්‍රී ලංකා ගමන් බලපත්‍ර නිකුත් කිරීමට සහායවූ නිලධාරීන්ට, ශ්‍රී ලංකා ගමන් බලපත්‍ර අයදුම්පත්‍රය සහතිකය කරන ලද සාම විනිසුරුවරයාට සහ විදේශගතවීමට සහායවූ විදේශ නියෝජිත ආයතන හිමියාට එරෙහිව මේ වනවිටත් ගෙන ඇති පියවර කවරේද;

(ii) රිසානාට එරෙහිව එරටේ අධිකරණයේ නඩු විභාගය පැවැත්වෙන අවස්ථාවේදී නිසි පරිදි කරුණු ඉදිරිපත් කිරීමට අපොහොසත්වූ ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය ඇයට එම දඬුවම හිමිවීම සම්බන්ධ සම්පූර්ණ වගකීම බාර ගත යුතු බව පිළිගන්නේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1173/'11

15.

ගරු තිස්ස අත්තනායක මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) රජය විසින් නිකුත් කරන ලද 6/2010 විශ්‍රාම වැටුප් චක්‍ර ලේඛයට අනුව 85% විශ්‍රාම වැටුප් හිමි වන්නේ ක්‍රියාන්විත ප්‍රදේශවල වසර 5ක සේවා කාලයක් සම්පූර්ණ කර ඇති විශ්‍රාමික රණවිරුවන්ට පමණක් බවත්;

(ii) ත්‍රිවිධ හමුදා නිලධාරීන් ලංකාවේ විවිධ පළාත්වල සේවය කරන්නේ ඔවුන්ගේ පුද්ගලික කැමැත්ත මත නොව විවිධ අවස්ථාවලදී අදාළ හමුදාවේ පරිපාලන සේවා අවශ්‍යතා මත බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) ත්‍රිවිධ හමුදාවේ සියලුම නිලධාරීන් විශ්‍රාම ගැන්වීමේදී එක හා සමානව සැලකිය යුතුබව එතුමා පිළිගන්නෙහිද?

(ඇ) එසේ නම්, විශ්‍රාම ගැන්වීමේදී ක්‍රියාන්විත සේවා කාලය සලකා විශ්‍රාම වැටුප් ප්‍රතිශතය ගණනය කිරීමෙන් ඇති වන විෂමතාව ඉවත් කිරීමට අදාළ බලධාරීන්ට උපදෙස් දෙන්නේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

# ප්‍රධාන කටයුතු ආරම්භයේ දී

## යෝජනා පිළිබඳ දැනුම්දීම

1.

ගරු අරුන්දික ප්‍රනාන්දු මහතා,— පනත් කෙටුම්පතක් ඉදිරිපත් කිරීමේ අවසරය,— පහත සඳහන් පනත් කෙටුම්පත ඉදිරිපත් කිරීමට අවසර දිය යුතුය:—

"පිය දසුන පදනම සංස්ථාගත කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි."

---

# යෝජනා පිළිබඳ දැනුම්දීම සහ දිනට නියමිත කටයුතු

*1.

ප්‍රවාහන අමාත්‍යතුමා,— මෝටර් වාහන පනත යටතේ නියෝග,— (203 වැනි අධිකාරය වන) මෝටර් වාහන පනතේ 237 වැනි වගන්තිය සමග කියවිය යුතු, එම පනතේ 9 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තියේ (ඇ) ඡේදය යටතේ සහ එම පනතේ 21, 22, 23 සහ 24 වැනි වගන්ති සමග කියවිය යුතු, 237 වැනි වගන්තිය යටතේ ප්‍රවාහන අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2011 මැයි 04 දිනැති අංක 1704/09 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2011.06.09 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතුය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය ලැබී ඇත)

*2.

පළාත් පාලන ආයතන (විශේෂ විධිවිධාන) පනත් කෙටුම්පත — කාරක සභාව

*3.

පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් (සංශෝධන) පනත් කෙටුම්පත — කාරක සභාව

*4.

සේවානියුක්තයන්ගේ විශ්‍රාම වැටුප් ප්‍රතිලාභ අරමුදල් පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*5.

විදේශ සේවානියුක්තයන්ගේ විශ්‍රාම වැටුප් ප්‍රතිලාභ අරමුදල් පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*6.

විශ්‍රාම වැටුප් (ආනුෂංගික විධිවිධාන) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*7.

සේවක අර්ථසාධක අරමුදල් (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*8.

මුදල් ව්‍යාපාර පනත් කෙටුම්පත— දෙවැනි වර කියවීම.

*9.

අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා,— විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනත යටතේ නියමය (අංක 1),— ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 44(2) වැනි ව්‍යවස්ථාව සමඟ කියවිය යුතු, 2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 2 වැනි වගන්තිය යටතේ විශේෂ වෙළඳ භාණ්ඩ බදු සම්බන්ධයෙන් ජනාධිපතිවරයා විසින් සාදන ලදුව, 2011 පෙබරවාරි 19 දිනැති අංක 1693/25 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2011.06.10 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතුය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය ලැබී ඇත)

*10.

අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා,— විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනත යටතේ නියමය (අංක 2),— ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 44(2) වැනි ව්‍යවස්ථාව සමඟ කියවිය යුතු, 2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 2 වැනි වගන්තිය යටතේ විශේෂ වෙළඳ භාණ්ඩ බදු සම්බන්ධයෙන් ජනාධිපතිවරයා විසින් සාදන ලදුව, 2011 අප්‍රේල් 8 දිනැති අංක 1700/22 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2011.06.10 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතුය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය ලැබී ඇත)

*11.

අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා,— විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනත යටතේ නියමය (අංක 3),— ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 44(2) වැනි ව්‍යවස්ථාව සමඟ කියවිය යුතු, 2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 2 වැනි වගන්තිය යටතේ විශේෂ වෙළඳ භාණ්ඩ බදු සම්බන්ධයෙන් ජනාධිපතිවරයා විසින් සාදන ලදුව, 2011 මැයි 02 දිනැති අංක 1704/7 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2011.06.10 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතුය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය ලැබී ඇත)

*12.

අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා,— රේගු ආඥාපනත යටතේ යෝජනාව,— (235 වැනි අධිකාරය වන) රේගු ආඥාපනතේ 10 වැනි වගන්තිය යටතේ ආනයන තීරු ගාස්තු සම්බන්ධයෙන් 2011.06.10 දින ඉදිරිපත් කරන ලද යෝජනාව අනුමත කළ යුතු ය.

(2011 මැයි 16 දිනැති අංක 1706/2 දරන අති විශේෂ ගැසට් පත්‍රය.)

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය ලැබී ඇත.)

*13.

අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා,— ආනයන හා අපනයන (පාලන) පනත යටතේ නියෝගය,— ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 44(2) වැනි ව්‍යවස්ථාව සමඟ කියවිය යුතු, 1985 අංක 48 දරන පනතින් සහ 1987 අංක 28 දරන පනතින් සංශෝධිත, 1969 අංක 1 දරන ආනයන හා අපනයන (පාලන) පනතේ 14 වැනි වගන්තිය සහ 4 වැනි වගන්තියේ (3) වැනි උපවගන්තිය සමග කියවිය යුතු, එම පනතේ 20 වැනි වගන්තිය යටතේ ජනාධිපතිවරයා විසින් සාදන ලදුව, 2011 මැයි 16 දිනැති අංක 1706/1 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2011.06.10 දින ඉදිරිපත් කරන ලද නියෝගය අනුමත කළ යුතුය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය ලැබී ඇත)

*14.

සෞඛ්‍ය අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාවේ වාර්ෂික වාර්තාව හා ගිණුම් 2008,— 1957 අංක 49 දරන රාජ්‍ය කාර්මික නීතිගත සංස්ථා පනතේ 30(2) සහ 1971 අංක 38 දරන මුදල් පනතේ 14(3) වගන්තිය යටතේ 2010.06.11 වැනි දින ඉදිරිපත් කරන ලද, 2008.12.31 වැනි දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් ශ්‍රී ලංකා රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාවේ වාර්ෂික වාර්තාව හා ගිණුම් අනුමත කල යුතුය.

(සෞඛ්‍ය කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාව විසින් සලකා බලන ලදී.)

*15.

සෞඛ්‍ය අමාත්‍යතුමා,— ශ්‍රී ජයවර්ධනපුර මහාරෝග්‍යශාලාවේ වාර්ෂික වාර්තාව හා ගිණුම් 2008,— 1957 අංක 49 දරන රාජ්‍ය කාර්මික නීතිගත සංස්ථා පනතේ 30(2) සහ 1971 අංක 38 දරන මුදල් පනතේ 14(3) වගන්තිය යටතේ 2010.09.23 වැනි දින ඉදිරිපත් කරන ලද, 2008.12.31 වැනි දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් ශ්‍රී ජයවර්ධනපුර මහාරෝග්‍යශාලාවේ වාර්ෂික වාර්තාව හා ගිණුම් අනුමත කල යුතුය.

(සෞඛ්‍ය කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාව විසින් සලකා බලන ලදී.)

*16.

තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යතුමිය,— කාර්මික තාක්ෂණ ආයතනයේ වාර්ෂික වාර්තාව 2008,— 1994 අංක 11 දරන විද්‍යා හා තාක්ෂණ වැඩි දියුණු කිරීමේ පනතේ 40(3) වගන්තිය සහ 1971 අංක 38 දරන මුදල් පනතේ 14(3) වගන්තිය අනුව 2010.12.03 වැනි දින ඉදිරිපත් කරන ලද, 2008.12.31 වැනි දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් කාර්මික හා තාක්ෂණ ආයතනයේ වාර්ෂික වාර්තාව අනුමත කල යුතුය.

(විද්‍යා හා තාක්ෂණ කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාව විසින් සලකා බලන ලදී.)

*17.

විදුලිබල හා බලශක්ති අමාත්‍යතුමා,— පරමාණුක ශක්ති අධිකාරිය වාර්ෂික වාර්තාව 2008,— 1969 අංක 19 දරන පරමාණුක ශක්ති අධිකාරි පනතේ 34 වගන්තිය අනුව සහ 1971 අංක 38 දරන මුදල් පනතේ 14(3) වගන්තිය අනුව 2010.06.30 වැනි දින ඉදිරිපත් කරන ලද, 2008.12.31 වැනි දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් පරමාණුක ශක්ති අධිකාරියේ වාර්ෂික වාර්තාව අනුමත කල යුතුය.

(විදුලිබල හා බලශක්ති කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාව විසින් සලකා බලන ලදී.)

*18.

වැවිලි කර්මාන්ත අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා තේ මණ්ඩල පනත යටතේ නියෝග,— 1975 අංක 14 දරන ශ්‍රී ලංකා තේ මණ්ඩල පනතේ 5 ආ සහ 5 ඇ වගන්ති සමඟ කියවිය යුතු, එකී පනතේ 25 වැනි වගන්තිය යටතේ ශ්‍රී ලංකා තේ මණ්ඩලය විසින් සාදන ලද සහ වැවිලි කර්මාන්ත අමාත්‍යවරයා විසින් අනුමත කරන ලදුව 2010 ඔක්තෝබර් මස 27 දිනැති, අංක 1677/14 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2011.01.04 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

*19.

ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යතුමා,— හිමිකම් ලියාපදිංචි කිරීමේ පනත යටතේ නියෝග,— 1998 අංක 21 දරන හිමිකම් ලියාපදිංචි කිරීමේ පනතේ 60 සහ 62 වැනි වගන්ති සමඟ කියවිය යුතු, එකී පනතේ 67 වැනි වගන්තිය යටතේ ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2009 අගෝස්තු 24 දිනැති, අංක 1616/23 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2010.05.06 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය ලැබී ඇත.)

*20.

අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා,— සුරාබදු ආඥාපනත යටතේ නියමය,— (52 වැනි අධිකාරිය වූ) සුරාබදු ආඥාපනතේ 25 වැනි වගන්තිය යටතේ, සංචාරක ප්‍රවර්ධන අධිකාරියේ අනුමතිය ලත් හෝටල් තුළ මධ්‍යසාර භාවිතය සම්බන්ධයෙන් මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2011 ජනවාරි 21 දිනැති අංක 1689/20 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2011.02.10 දින ඉදිරිපත්කරන ලද නියමය අනුමත කළ යුතු ය.

(අංක 935 දරන සුරාබදු නිවේදනය)

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය ලැබී ඇත.)

21.

සමනලගිරි සතරාංග (නාඩි) වෛද්‍ය සභාව (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

22.

ඔලගංගල මහා සුදර්ශන පරෝපකාරී පදනම (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම

23.

ලෙස්ටර් ජේම්ස් පීරිස් සහ සුමිත්‍රා පීරිස් පදනම (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම

24.

රාජ්‍ය සේවක සංවර්ධන මූල්‍ය සංස්ථාව (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*** සලකුණෙන් හඳුන්වනු ලබන්නේ ආණ්ඩුවේ කටයුතු ය.**